# පශ්චාත් යුධ සමයේ මුහුදු වැදි ජනතාව කෙරෙහි සිදු කළා වූ සංවර්ධන ව්‍යාපෘතිය ඔවුන්ගේ ජන ජීවිතය කෙරෙහි ඇති කළ බලපෑම පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යනයක්

ඩබ්.කේ.එම්. විජයරත්න[1], ඒ.ඒ.සී.එන්. අමරකෝන්[2], එච්.එම්.කේ.පී. දුෂ්මන්ත[3]
ඒ.පී.කේ.සී. ගුණවර්ධන[4],ජී.ඒ.ඩී.පී. මධුශංක[5]

මානව විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
[1]wkmyc94727@gmail.com,[2]chathurungani@gmail.com,[3]kalindudush94@gmail.com,[4]Kcgunewardhena93@gmail.com,[5]gayanjagoda2@gmail.com

ප්‍රමුඛ පදඃ සංවර්ධන ව්‍යාපෘති, මුහුදු වැදි ජනතාව, පශ්චාත් යුධ සමය

## හැඳින්වීම

ශ්‍රී ලාංකික ආදිවාසික ජනතාවගේ සම්භවය හා විකාශනය ඉතා ඈත අතීතයට ගමන් කරයි. සාමූහික වශයෙන් දඹාන, හෙන්නානිගල, පොල්ලෙබැද්ද, රතුගල, නිල්ගල ආදී ප්‍රදේශවල විසූ ආදිවාසී ජනතාව මහවැලි සංවර්ධන ක්‍රියාවලිය හේතුවෙන් ශ්‍රී ලංකාවේ උතුර, නැගෙනහිර යනාදී පළාත්වල ස්ථාපිත කරනු ලැබීය. මෙයිනුදු වාකරේ, ත්‍රිකුණාමලය යනාදී මුහුදුබඩ ප්‍රදේශ ආශ්‍රය කොටගෙන පදිංචි වූ ආදිවාසී ජනතාව "මුහුදු වැද්දන්" ලෙස හඳුන්වනු ලැබේ. ශ්‍රී ලංකාවේ පැවති 30 වසරක යුද්ධය හේතු කරගෙන මෙම ආදිවාසී ජනතාවට ස්වකීය වාසස්ථාන හැර දමා ආරක්ෂිත ස්ථාන කරා යොමු වීමට සිදු විය. යුද්ධය නිමාවත් සමඟ අවතැන් කඳවුරුවල සිටි මුහුදු වැදි ජනතාව තම වාසභූමි කරා යළි පැමිණි නමුත් එකී නිවාස පදිංචියට සුදුසු තත්වයක නොතිබුණි. මෙකී හේතූන් පදනම් කරගෙන රජයෙන් මෙන්ම රාජ්‍ය නොවන සංවිධානද මැදිහත් වීමෙන් නිවාස හා යටිතල පහසුකම් ආදී සංවර්ධන ව්‍යාපෘතීන් මුහුදු වැදි ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක කරනු ලැබීය. කෙසේ වුවත් මෙකී සංවර්ධන ව්‍යාපෘතීන් හේතු කොටගෙන උක්ත වැදි ජනතාව ඒවායේ ප්‍රතිඵල නිසි පරිදි ලැබුවේද, එකී සංවර්ධන ව්‍යාපෘතීන් ඔවුන්ගේ සංස්කෘතික වපසරියට සමපාත වූයේද, යථාර්තවාදී සංවර්ධන ක්‍රියාවලියක ප්‍රතිඵල වාකරේ මුහුදු වැදි ජනතාව ලැබුවේද යනාදී කරුණු මෙහිදී විමසුමට ලක් කිරීමට අප බලාපොරොත්තු වේ.

## ක්‍රමවේදය

වාකරේ ප්‍රදේශය ආශ්‍රිතව රාජ්‍ය මට්ටමින් මෙන්ම රාජ්‍ය නොවන සංවිධාන ඔස්සේද විවිධාකාරයේ සංවර්ධන ව්‍යාපෘතීන් දියත් කරනු ලැබීය. මෙකී සංවර්ධන ව්‍යාපෘතීන් අතරින් මුහුදු වැදි ජනතාව පාදක කොටගෙන සිදු කෙරුණු සංවර්ධන ව්‍යාපෘති තරමක් විශේෂ වේ.
එකී සංවර්ධන ව්‍යාපෘතීන් හරහා ලැබූ ප්‍රතිලාභවල ස්වභාවයද පෘථුල වැදගත්කමක්, සෛද්ධාන්තික ප්‍රවේශයක් උසුලන්නකි. මෙම පර්යේෂණය තුළින් අදාළ සංවර්ධන කාර්යයන්ගේ උක්ත ප්‍රතිලාභයන්ගේ වැදගත්කම අදාළ ආදිවාසී ජනතාවට බලපෑ ඇති අන්දම සංසන්දනාත්මක ව විශලේෂණය කර තිබේ.

නැගෙනහිර පළාතේ වාකරේ ප්‍රදේශය ඇසුරින් සිදු කරනු ලැබූ මෙම පර්යේෂණය

කාර්යය සඳහා වැය කළ හැකි කාලය, ශ්‍රමය හා මූල්‍ය සම්පත් අවම බැවින් සීමා සහිතව මෙම පර්යේෂණය සිදු කර ඇත. මෙහිදී ආදිවාසී ජන නායකයන්ද ඇතුළත් වන පරිදි නිශ්චිතව තෝරාගත් පවුල් 20ක් ආශ්‍රය කර ගෙන සම්මුඛ පරීක්ෂණ උප ලේඛණයක් ආධාරයෙන් සහභාගීත්ව නිරීක්ෂණය යටතේ අදාළ දත්ත රැස් කිරිම සිදු කරන ලදී. ඒ අනුව පශ්චාත් යුධ සමය හේතු කර ගෙන දියත් වූ සංවර්ධන ව්‍යාපෘතී හරහා මුහුදු වැදි ජනතාව ලැබූ ප්‍රතිලාභයන්ගේ සාර්ථක අසාර්ථක භාවය විශ්ලේෂිත දත්තයන් ආශ්‍රයෙන් පර්යේෂණ නිගමනයන් හා යෝජනාවන් ඉදිරිපත් කර ඇත.

**සාකච්ඡාව**

කුංජම්කල්කුලම්, මේවාන්ඩකුලම් හා මිනිමිත්තිවිලයන ගම්මානයන්හි සිදුවූ නිවාස සංවර්ධන ව්‍යාපෘතිය පිළිබඳව අවධානය යොමු කිරීමේ දී එම නිවාසවල ප්‍රමිතියෙහි අඩු බවක් හඳුනාගැනිමට හැකිවිය. මෙම නිවාසයන්හි නිසි සැලැස්මක් නොමැති වීම හේතුවෙන් නිවාස ඉදිකර වසර 09 ක් වැනි සුළු කාලයක් අද වන විට ගත වී තිබුණද සෑම නිවසක්ම අබලන් තත්වයට පත්ව ඇත. ගැමියා පවසනුයේ මේනිවාස හෙවනට පමණක් සෑහෙන බවයි. මෙම නිවාස සංවර්ධනයත් සමඟ ජනතාවගේ සෞඛ්‍ය හා සනීපාරක්ෂක තත්ත්වය වැඩි දියුණු කිරීමට සෑම නිවාසයකටම වැසිකිලිය බැගින් ලබා දුන්නද ඒවා පරිහරණයට ඇතැම් වැසිකිලිවල ජල පහසුකම් නොමැත. වැසිකිලියට ජල පහසුකම් පැවතියද එම වැසිකිලි පරිහරණය කිරීම පිළිබඳව අවබෝධයක් ඔවුන්ට නොමැත. එම නිසා එම වැසිකිලි ඔවුන් වෙනත් කාර්යයන් සඳහා භාවිතා කරනු ලැබේ. එනම් දර දැමීමට, සතුන් කූඩු කර තැබීමට ආදියයි. මෙය මුහුදු වැදි ජනයාගේ ජීවන තත්ත්වය නඟා සිටුවීමට සිතා ලබා දුන් සතුන් නුවරඑළිය, බණ්ඩාරවෙල වැනි ශිත දේශගුණයක් පවතින ප්‍රදේශවලින් ගෙන ඒම නිසා වාකරේ වැනි උෂ්ණාධික ප්‍රදේශයකට ඔවුන් ඔරොත්තු නොදීමෙන් වැඩි සතුන් ප්‍රමාණයකට මරණය උරුම විය. එනම් සංවර්ධනයෙහි කඩතොළු පවතින බව ගම්‍ය වේ. එමෙන්ම ඇතැම් සංවර්ධන ක්‍රියාමාර්ග ඇති කිරීමට සිතා යම් යම් සේවාවන් හා භාණ්ඩ ලබා දුන්න ද ඒවායෙහි වටිනාකම පිළිබඳව අවබෝධයක් නොමැතිකම හා එම සංවර්ධන ක්‍රියාමාර්ග නිසි ලෙස භාවිත නොකිරීම හේතුවෙන් එම සම්පත් ගම තුළම දිරා පත් වෙමින් පවතී. එනම් කෘෂි උපකරණ නිවාස තුළම දිරා පත් වීම, නිසි පිළිවෙලට සකස් කළාවූ ගව ගාල් ආදිය මේ අතර සුවිශේෂී වේ. මෙලෙස අධ්‍යයනයේ සියලු තොරතුරු හා දත්ත විශ්ලේෂණයන් දෙස අවධානය යොමු කිරීමේ දී අවසාන වශයෙන් එළඹිය හැකි නිගමනය වන්නේ සංවර්ධනය මුවාවෙන් ක්‍රියාත්මක වී ඇති සංවර්ධන ව්‍යාපෘතීන් තුළින් සැබෑ ලෙසින්ම ජනතාව ආර්ථික, සංස්කෘතික සූරා කෑමකට ලක්ව ඇති බවයි. මේ සංවර්ධන ක්‍රියාදාමය තුළ හඳුනාගත හැකි දුර්වලතාවන්ද රැසකි. මෙලෙස මෙම සංවර්ධන ව්‍යාපෘති අසාර්ථක වීම කෙරෙහි බලපා ඇති ප්‍රධානතම හේතු සාධකයන් ලෙස මෙම ජනයාගෙන් පෙර විමසුමක් නොකිරීම හා සංවර්ධන සැලසුම්කරුවන් වීදුරු කාමර ඇතුලේ සිට සංවර්ධන ව්‍යාපෘති සැකසීම සිදු කිරීමයි. මෙලෙස ප්‍රදේශයේ ජනතාවගෙන් මේ පිළිබඳව විමසා ක්ෂේත්‍රයට ගොස් පර්යේෂණය සිදුකර සංවර්ධන සැලසුම් සකස් කලේ නම් මේ සංවර්ධනය සැලකිය යුතු මට්ටමකින් සාර්ථක වනු ඇත.

**ආශ්‍රිත ග්‍රන්ථ**


ජයතිලක, දේවිකා යසාංජලී. (2009)*ආදිවාසී සමාජ II.* කර්තෘ ප්‍රකාශන.

පෙරේරා, ටෙනිසන්. (2009)*සමාජ විද්‍යාව.* වින්දන ප්‍රකාශන.

රත්නපාල, නන්දසේන. (2007)*සමාජ විද්‍යාවේ මූලධර්ම.*සීමාසහිත ස්ටැම්ෆර්ඩ් ලේක් ප්‍රකාශන.